# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2434/05 - 2025 අප්‍රේල් මස 28 වැනි සඳුදා - 2025.04.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2018 අංක 35 දරන මුදල් පනත යටතේ වන නිවේදනය

මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද

2018 අංක 35 දරන මුදල් පනතේ 51 වන වගන්තිය සමඟ කියවිය යුතු 19 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය, අනුර කුමාර දිසානායක වන මම, මෙම නියෝගය මඟින් 2025 ජනවාරි 31 දිනැති අංක 2421/41 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනය මඟින් අවසන් වරට සංශෝධනය කරන ලද 2019 ඔක්තෝබර් 31 දිනැති අංක 2147/72 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනයේ ප්‍රකාශයට පත් කරන ලද නියෝග පහත පරිදි සංශෝධනය කරමි:

1. එහි I වන උපලේඛනයේ I වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 8703.80.71 සහ 8703.80.72 හා ඊට අනුරූප විස්තර සහ II වන සහ III වන තීරුවල නිශ්චිතව දක්වා ඇති අනුරූපී සටහන් අවලංගු කිරීම; සහ
2. මෙහි උපලේඛනයේ I වන සහ II වන තීරුවල නිශ්චිතව දක්වා ඇති අනුරූපී සටහන් හා ඒ සඳහා අදාළ වන III වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති සුඛෝපභෝගී බදු නිදහස් සීමාව ඉක්මවා යන ප්‍රමාණය මත අදාළ වන මෝටර් වාහන සඳහා සුඛෝපභෝගී බදු අනුපාත ඇතුලත් කිරීම.

මෙම නියෝගය 2025 අප්‍රේල් මස 29 වන දින සිට බලපැවැත්වෙනු ඇත.

**අනුර කුමාර දිසානායක,**
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික
සංවර්ධන අමාත්‍ය.

2025 අප්‍රේල් මස 28 වන දින,
කොළඹ 01,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

1A - PG 7086 — 454 (2025/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය

| I | | | II | III |
|---|---|---|---|---|
| *ශීර්ෂ අංකය* | *සංයෝජිත වර්ගීකරණ සංකේතාංකය* | *විස්තරය* | *සුඛෝපභෝගී බදු නිදහස් සීමා වටිනාකම* | *අනුප්‍රමාණය (සුඛෝපභෝගී බදු නිදහස් සීමාව ඉක්මවා යන ප්‍රමාණය මත අදාල වේ)* |
| **87.03** | | **(87.02 ශීර්ෂයේ ඒවා හැර), ස්ටේෂන් වැගන් සහ රේසිං කාර් ඇතුළුව ප්‍රධාන වශයෙන් පුද්ගලයන් ප්‍රවාහනය කිරීම සඳහා සැලසුම් කරන ලද මෝටර් කාර් සහ අනෙකුත් මෝටර් වාහන.** | | |
| | 8703.80 | අනෙකුත් වාහන, ඉදිරියට පැදවීම සඳහා විදුලි මෝටරයක් පමණක් සහිත: | | |
| | | අනෙකුත්, විදුලි ඇකියුම්ලේටරය ආරෝපණය කිරීම සඳහා පමණක් පුළිඟු ජ්වලන අභ්‍යන්තර දහන පිස්ටන් එන්ජිම සහිත, බාහිර විදුලිබල ප්‍රභවයකට ප්ලග් කිරීම මගින් ආරෝපණය කළ නොහැකි: | | |
| | 8703.80.71 | මෝටර් ධාරිතාවය කිලෝ වොට් 50 නොඉක්මවන, අවුරුදු තුනකට වඩා නොපැරණි | රු. මිලියන 6.0 | 60% |
| | 8703.80.72 | මෝටර් ධාරිතාවය කිලෝ වොට් 50 නොඉක්මවන, අවුරුදු තුනකට වඩා පැරණි | රු. මිලියන 6.0 | 60% |
| | 8703.80.73 | මෝටර් ධාරිතාවය කිලෝ වොට් 50 ඉක්මවන එහෙත් කිලෝ වොට් 100 නොඉක්මවන, අවුරුදු තුනකට වඩා නොපැරණි | රු. මිලියන 6.0 | 60% |
| | 8703.80.74 | මෝටර් ධාරිතාවය කිලෝ වොට් 50 ඉක්මවන එහෙත් කිලෝ වොට් 100 නොඉක්මවන, අවුරුදු තුනකට වඩා පැරණි | රු. මිලියන 6.0 | 60% |
| | 8703.80.75 | මෝටර් ධාරිතාවය කිලෝ වොට් 100 ඉක්මවන එහෙත් කිලෝ වොට් 200 නොඉක්මවන, අවුරුදු තුනකට වඩා නොපැරණි | රු. මිලියන 6.0 | 60% |
| | 8703.80.76 | මෝටර් ධාරිතාවය කිලෝ වොට් 100 ඉක්මවන, එහෙත් කිලෝ වොට් 200 නොඉක්මවන, අවුරුදු තුනකට වඩා පැරණි | රු. මිලියන 6.0 | 60% |
| | 8703.80.77 | මෝටර් ධාරිතාවය කිලෝ වොට් 200 ඉක්මවන, අවුරුදු තුනකට වඩා නොපැරණි | රු. මිලියන 6.0 | 60% |
| | 8703.80.78 | මෝටර් ධාරිතාවය කිලෝ වොට් 200 ඉක්මවන, අවුරුදු තුනකට වඩා පැරණි | රු. මිලියන 6.0 | 60% |
| | | අනෙකුත්, විදුලි ඇකියුම්ලේටරය ආරෝපණය කිරීම සඳහා පමණක් සම්පීඩන ජ්වලන අභ්‍යන්තර දහන පිස්ටන් එන්ජිම (ඩීසල් හෝ අර්ධ ඩීසල්) සහිත, බාහිර විදුලිබල ප්‍රභවයකට ප්ලග් කිරීම මගින් ආරෝපණය කළ නොහැකි: | | |
| | 8703.80.81 | මෝටර් ධාරිතාවය කිලෝ වොට් 50 නොඉක්මවන, අවුරුදු තුනකට වඩා නොපැරණි | රු. මිලියන 6.0 | 60% |
| | 8703.80.82 | මෝටර් ධාරිතාවය කිලෝ වොට් 50 නොඉක්මවන, අවුරුදු තුනකට වඩා පැරණි | රු. මිලියන 6.0 | 60% |

| *I* | | | *II* | *III* |
|---|---|---|---|---|
| *ශීර්ෂ අංකය* | *සංයෝජිත වර්ගීකරණ සංකේතාංකය* | *විස්තරය* | *සුඛෝපභෝගී බදු නිදහස් සීමා වටිනාකම* | *අනුප්‍රමාණය (සුඛෝපභෝගී බදු නිදහස් සීමාව ඉක්මවා යන ප්‍රමාණය මත අදාල වේ)* |
| | 8703.80.83 | මෝටර් ධාරිතාවය කිලෝ වොට් 50 ඉක්මවන, එහෙත් කිලෝ වොට් 100 නොඉක්මවන, අවුරුදු තුනකට වඩා නොපැරණි | රු. මිලියන 6.0 | 60% |
| | 8703.80.84 | මෝටර් ධාරිතාවය කිලෝ වොට් 50 ඉක්මවන, එහෙත් කිලෝ වොට් 100 නොඉක්මවන, අවුරුදු තුනකට වඩා පැරණි | රු. මිලියන 6.0 | 60% |
| | 8703.80.85 | මෝටර් ධාරිතාවය කිලෝ වොට් 100 ඉක්මවන, එහෙත් කිලෝ වොට් 200 නොඉක්මවන, අවුරුදු තුනකට වඩා නොපැරණි | රු. මිලියන 6.0 | 60% |
| | 8703.80.86 | මෝටර් ධාරිතාවය කිලෝ වොට් 100 ඉක්මවන, එහෙත් කිලෝ වොට් 200 නොඉක්මවන, අවුරුදු තුනකට වඩා පැරණි | රු. මිලියන 6.0 | 60% |
| | 8703.80.87 | මෝටර් ධාරිතාවය කිලෝ වොට් 200 ඉක්මවන, අවුරුදු තුනකට වඩා නොපැරණි | රු. මිලියන 6.0 | 60% |
| | 8703.80.88 | මෝටර් ධාරිතාවය කිලෝ වොට් 200 ඉක්මවන, අවුරුදු තුනකට වඩා පැරණි | රු. මිලියන 6.0 | 60% |
| | | අනෙකුත් | | |
| | 8703.80.91 | අවුරුදු තුනකට වඩා නොපැරණි | රු. මිලියන 6.0 | 60% |
| | 8703.80.92 | අවුරුදු තුනකට වඩා පැරණි | රු. මිලියන 6.0 | 60% |

EOG - 04 - 0205

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.